# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1995/23 – 2016 නොවැම්බර් 30 වැනි බදාදා – 2016.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුව සුළු කොට්ඨාසයේ මින්නේරිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක PO/HKG/2012/346 හා 2012.09.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0637ක් පමණ වන වත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0637ක් පමණ**

උතුරට: බී.එල්. පීටර් හිමිකම් කියන ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මින්නේරිය රත්මලේ රක්ෂිතය සහ කැබලි අක්ෂර බී; දකුණට: මින්නේරිය ජල පවිත්‍රාගාරය පිහිටි ඉඩම; බටහිරට: බී.එල්. පීටර් හිමිකම් කියන ඉඩමේ ඉතිරි කොටස.

ජෝන් ඒ. ඊ. අමරතුංග,  
ඉඩම් අමාත්‍ය.

මාගේ අංකය: 4-3/9/2012/ඩබ්ලිව්එස්/54.  
2016 ඔක්තෝබර් මස 13 වැනි දින,  
ඉඩම් අමාත්‍යාංශය,  
"මිහිකත මැදුර",  
රජමල්වත්ත පාර,  
බත්තරමුල්ල.

12 – 620

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ජේදයේ විස්තර කරනු ලබන පරවශතාව, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාව අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ජේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.**– විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතාවය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 834, කුරුණෑගල නගරය ඊසාන ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ කුරුණෑගල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයු/කේආර්එන්/2015/281 හා 2015.06.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0134ක් පමණ වන 'පැරමවුන්ට්වත්ත' නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පැරමවුන්ට් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0134ක් පමණ**

උතුරට: එන්. එම්. ගමගේ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මැගසින්කන්ද; නැගෙනහිරට: මැගසින්කන්ද, පාර සහ විවෘත මුඩුබිම; දකුණට: විවෘත මුඩුබිම සහ සූරතිස්ස මාවත; බටහිරට: සූරතිස්ස මාවත සහ එන්. එම්. ගමගේ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2015/ඩබ්ලිව්එස්/29.
2016 ජුනි මස 01 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12 – 621

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.